කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව
අනුරාධපුර දිස්ත්‍රික්කය
---------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2018 මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුලි 12 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
----------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | අදාල ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළයුතු වේ | පිළිගතිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාලව රු.117,597 ක් වූ වෙනත් ආදායම් ලැබීම් ආදායම් ආධාර යටතේ ගිණුම්ගත කර තිබුණි. | ආදායම් නිවැරදිව වර්ගීකරණය කර ගත යුතු වේ | පිළිගතිමි. |
| (iii) | වර්ෂ කිහිපයක සිට පැවත එන ටෙන්ඩර් තැන්පතු ගිණුමේ වටිනාකමින් රු. 3,707,731 ක් වූ වටිනාකම සමාලෝචිත වර්ෂයේ ටෙන්ඩර් කුලී ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගතිමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.1,604,320 ක් වූ වත්කම් අයිතම 08 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | පිළිගතිමි. |
| (v) | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂයේදී සභාවට ලබා දී | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | පිළිගතිමි. |

| | | | |
|---|---|---|---|
| | තිබුණු ගැල්වනයිස් බට තොගයෙන්, බට 188 ක රු.208,143 ක් වූ වටිනාකම ස්ථාවර වත්කම් යටතේ දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | | |
| (vi) | පිළිසරු මධ්‍යස්ථානය වෙත ලබා දී තිබුණු හලර් යන්ත්‍රයේ වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | පිළිගතිමි. 2019 වර්ෂයේ ගිණුම්ගත කිරිමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

--------------- ------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන වියදම් ගිණුමේ ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු.15,332,885 ක් සහ පොදු ලෙජරය අනුව රු.15,262,885 ක් ලෙස දක්වා තිබීම නිසා රු.70,000 ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගතිමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වර්ෂ 03 කට පෙර සිට පැවත එන රු.31,763 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගතිමි. |
| (ii) | වර්ෂ 5 සිට 10 දක්වා කලක සිට පැවත එන රු.3,969,364 ක් වූ ටෙන්ඩර් තැන්පත් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගතිමි. |
| (iii) | වර්ෂ 05 කට පෙර සිට පැවත එන රු.527,221 ක් වූ ජල සැපයුම් ණයහිමි ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගතිමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු 21,192,252 ක්වූ ගිණුම් විෂයයන් 09 කට අදාලව විස්තරාත්මක උපලේඛන ආදායම් වාර්තා සහ උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | සනාථ කිරීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | පිළිගතිමි. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට අනුකූල නොවීම.

| | නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති සංග්‍රහය | | | |
| (i) | රීති 59 | සභා බල ප්‍රදේශයේ ව්‍යාපාර හා කර්මාන්ත බදු සම්බන්ධයෙන් සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | රීති අනුව කටයුතු කළයුතු **වේ.** | 2019 වර්ෂයට අදාල සමීක්ෂණය සිදුකර ඇත. |
| (ii) | රීති 217 හා 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ප්‍රා.ස 46 ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් පරික්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. | රීති අනුව කටයුතු කළයුතු වේ. | උපදෙස් පරිදි ඉදිරියේදී කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළයුතු වේ. | පරිගණක උපාංග හා මෘදුකාංග ලේඛණය නඩත්තු කරමින් පවතී. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,649,539 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.1,687,482 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 850,000 | 832,985 | 832,985 | - | 510,000 | 570,400 | 570,400 | - |
| කුලී | 7,715,924 | 8,926,673 | 9,024,562 | 226,136 | 5,423,907 | 3,997,458 | 3,673,433 | 324,025 |
| බලපත්‍ර ගාස්තු | 2,290,000 | 473,020 | 473,020 | - | 535,000 | 1,161,543 | 1,161,543 | - |
| වෙනත් ආදායම් | 18,010,943 | 14,148,149 | 15,580,953 | 1,275,609 | 2,460,000 | 16,166,578 | 13,458,165 | 2,708,413 |
| එකතුව | 28,866,867 | 24,380,827 | 25,911,520 | 1,501,745 | 8,928,907 | 21,895,979 | 18,863,541 | 3,032,438 |

2.2.2 වරිපනම් හා බදු
-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (i) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ දියුණුකළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු පැනවීමට කටයුතු කර නොතිබුණි. | පනතට අනුව කටයුතු වේ. | දියුණුකළ ප්‍රදේශ හඳුනාගෙන සිතියම් ගත කර ඉදිරි වැඩ කටයුතු කරමින් පවතී. |

2.2.3 වෙනත් ආදායම්
-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුලදී සභාව සතු වාහන සහ යන්ත්‍ර කුලියට ලබා දීමේදී විධිමත් අනුමැතියක් ලබාගැනීමකින් තොරව ලබාදී තිබුණු අතර වැඩකළ මීටර් පැය හෝ ධාවන කිලෝමීටර් ගණන පදනම්ව කුලී අයකර ගෙන නොතිබුණි. | යන්ත්‍ර පැය සහ කි.මී අනුව කුලී අයකර ගත යුතු වේ | යන්ත්‍ර පැය හා කි.මී අනුව කුලි අයකර ගෙන නොමැත්තේ සභා තීරණ මත හා පොදු ඉල්ලීම් මත සේවාවන් ලබාදීම නිසාය.ජුලි මාස සිට දක්වා ඇති පරිදි කටයුතු කිරිමට සටහන් කර ගතිමි. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු
----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.918,259 ක් සහ මුද්දර ගාස්තු රු.357,350 ක් විය. | වර්ෂයේ ආදායම් කාර්යක්ෂමව අයකර ගත යුතු වේ. | 2018 වර්ෂය අවසාන වන විට දක්වා ඇති ශේෂයන් පමණක් පවතින බව දන්වා සිටිමි. |

03. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

3.1 කාර්ය සාධනය
-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා, පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ). අතුරු ව්‍යවස්ථා
----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීම සිදුකර ප්‍රාදේශීය සභා පනත ක්‍රියාත්මක කළයුතු වේ. | අතුරු ව්‍යවස්ථා සකස් කිරීම සඳහා සභා නිලධාරීන් සතු දැනුම් ප්‍රමාණවත් නොවන නිසා කටයුතු ප්‍රමාද වී ඇත. |

(ආ). ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළයුතුවේ. | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම අතපසුවී ඇත. 2019 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමින් පවතී. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතින්ගේ සංවිධානයන්ට තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි. | 2030 තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට අදාල වන කාර්යය හා කර්තව්‍ය සභාව විසින් ඉටු කළයුතු වේ. | නිර්නායකයන් 2020 අයවැය සකස් කිරීම සඳහා පාදක කර ගන්නා බව දන්වා සිටිමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ). | සමාලෝචිත වර්ෂයට අදාලව රු.231,751,690 ක වටිනාකමකින් යුතු ජ්නල සටහන් 41 ක් කිසිදු අනුමැතියක් ලබානොගෙන ගිණුම්ගත කර තිබුණු අතර ගිණුම් තැබීමේ කටයුතු පිළිබඳව වගකිවයුතු නිලධාරීන් නිසි අධීක්ෂණයන් සිදුකර නොතිබුණි. | ජ්නල සටහන් සඳහා ජ්නල වවුචර් සකස්කර අනුමත කරවා ගත යුතු වේ. | පිළිගනිමි. |
| (ආ) | 2014 වර්ෂයේදී එවකට සිටි සභාපතිවරයා සහ මන්ත්‍රීවරුන් හට ලබා දී තිබුණු රු.97,429 ක් වටිනා ගැල්වනයිස් බට 88 ක් සභාව වෙත ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු වත්කම් භාරයට ගැනිමට කටයුතු කළයුතු වේ. | ලිඛිතව සහ වාචිකව දැනුවත් කර ඇත. ආපසු භාර නොදන්නේනම් වෙළඳපොල මිල තක්සේරුව පදනම්ව අය කිරීම සිදු කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභාවේ සේවක පුරප්පාඩු තනතුරු 18 ක් පැවති අතර අතිරික්ත තනතුරු 01 ක් පැවතුණි. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කර මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි කර ගත යුතුවේ. | පුරප්පාඩු පිළිබඳව පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇත. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වසර කිහිපයක සිට පැවත එන සේවය හැරගිය නිලධාරියෙකුගෙන් සහ විශ්‍රාමගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.81,161 ක ණය ශේෂයක් පැවතුණි. | සේවක ණය කාලීනව අයකර ගත යුතු වේ. | සේවය හැර ගිය නිලධාරීන්ගේ ණය ඇපකරුවන්ගෙන් අයකර ගැනිමට කටයුතු කරන අතර විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය පිළිබඳ තොරතුරු විශ්‍රාම අධ්‍යක්ෂවරායගේ විමසා යවා ඇත. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතු බස් නැවතුම්පල කඩකාමර, කැබිතිගොල්ලෑව පුස්තකාල ගොඩනැගිලි, වාහල්කඩ සතිපොල කඩකාමර සමඟ වැසිකිළි පද්ධතිය සහ වාහල්කඩ පුස්තකාල ගොඩනැගිලි වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කළයුතුවේ. | සියළුම තොරතුරු රැස්කර ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනිමට තක්සේරු වාර්තා ලබාගැනීමට පියවර ගනිමි. |

3.4.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභාව විසින් පරිහරණය කරනු ලබන රු.6,209,763 ක වටිනාකමින් යුතු වාහන 7 ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු වත්කම් සභාවට පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | පළාත් පාලන අමාත්‍යාංශය මගින් ගත යුතු ඉදිරි පියවර සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. |

3.4.3 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේදී සභාව වෙත ලැබුණු රු.2,175,000 ක් වටිනා ෆෝටෝන් වර්ගයේ ට්‍රැක්ටරය 2016 වර්ෂයේ සිට මේ දක්වා කිසිදු ප්‍රයෝජනයකට නොගෙන සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි. | නිශ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනිමට කටයුතු කළයුතු වේ. | දැනට අත්‍යවශ්‍ය සේවාවන් සඳහා ප්‍රමාණවත් ට්‍රැක්ටර් පවතින අතර මෙම ට්‍රැක්ටර් සේවයේ යෙදවීමට ප්‍රමාණවත් රියදුරු නොමැති බැවින් ගාල්කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභා පරිශ්‍රයේ රඳවා තිබෙන රු.1,227,950 ක් වූ වාහන 03 ක් අක්‍රිය තත්වයේ පවතින අතර මෙම වාහන අළුත්වැඩියා කර භාවිතයට ගැනිමට හෝ 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කිරිමට කටයුතු කර නොතිබුණි. | අක්‍රිය තත්වයේ පවතින වාහන අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනිමට හෝ අපහරණය කිරිමට කටයුතු කළයුතු වේ. | යතුරුපැදිය අළුත්වැඩියා කිරිමට කටයුතු කර ඇති අතර අනෙක් වාහන දෙක අයිතිය පවරා ගෙන අපහරණය කිරිමට කටයුතු සිදු කරමි. |
| (ඇ) | වර්ෂ ගණනාවක සිට භාවිතයට නොගෙන අනාරක්ෂිතව සභා පරිශ්‍රයේ රඳවා තිබෙන රු.500,000 ක වටිනාකමින් යුත් විදුලි ජනක යන්ත්‍රය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ ආරක්ෂිතව තබා ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | විදුලි ජනක යන්ත්‍රය අළුත්වැඩියා කර ආරක්ෂිතව රඳවා ගෙන භාවිතයට ගත යුතු වේ. | පිළිතුරු සපයා නොමැත. |

3.5 ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලැස්මක් පිලියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළයුතු වේ. | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරිමට කටයුතු සිදු කරමින් පවතී. |

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
----------------------------------------
විගණන හා කළමණාකරන කමිටු ක්‍රියාත්මක කිරීම
------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009(1)(i) දරන මුදල් අමාත්‍යාංශ කළමණාකරන විගණන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව 2018 වර්ෂය සඳහා විගණන හා කළමණාකරන කමිටු පවත්වා නොතිබුණි. | චක්‍රලේඛයට අනුව විගණන හා කළමණාකරන කමිටු පැවැත්විය යුතු වේ. | මෙම වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරමි. |